**නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය - 2022**
**------------------------------------------------------------**

නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3706 දරන ණය ගිවිසුමේ 4.02 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රමුඛ නාගරික ව්‍යාපෘති සඳහා සක්‍රීය ඉහළ මට්ටමේ සූදානමක් ඇති කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,090.98 කට සමාන එ.ජ.ඩො. මිලියන 5.74 ක් වන අතර ඉන් රු.මිලියන 883.88 කට සමාන එ.ජ.ඩො. මිලියන 4.65ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මාර්තු 06 දින ආරම්භ කරන ලද අතර 2022 මාර්තු 31 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 අගෝස්තු 18 දිනැති අංක ER/AB/US/01(vol i) දරන ලිපිය ප්‍රකාරව එම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සියල්ල 2020 වර්ෂය අවසානයේදී නතර කර තිබුණු අතර ආසියානු සංවර්ධන බැංකුවේ 2022 අප්‍රේල් 27 දිනැති ලිපිය ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් කලයුතු දිනය 2024 මාර්තු 31 දින දක්වා නැවත කාලය දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2022 දෙසැම්බර් 31 දිනට නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති,රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (අ) | මු.රෙ. 753(1) හා (2) | 2022 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 7.291 ක් වටිනා වත්කම් මහ නගර සභා වෙත පවරා දී මූල්‍ය ප්‍රකාශනවලින් කපා හැර තිබුණද, ඉහත මහ නගර සභා විසින් භාණ්ඩ ලැබීම් පත්‍ර හෝ වෙනත් ලිඛිත සාක්ෂි වැනි ලේඛනමය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එම වත්කම් අදාල මහ නගර සභාවලට කමිටුවක් මගින් ලබා දී තිබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | | |
| a) උපදේශන ආයතනය | | | | | |
| SMEC | ගමනාගමනය, ප්‍රවාහන සහ සංචලනය වැඩිදියුණු කිරීම (Traffic, Transportation and Mobility Improvement) | 96 | 42 | ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 වන විට උපදේශන ආයතන විසින් සිදු කරන ලද කාර්යයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය සියයට 42 සහ 68 පරාසයක පැවතුනි. | ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම |
| ECL | නාගරික වැඩිදියුණු කිරීම සහ උරුමයන් (Urban Upgrading and Heritage) | 96 | 68 | | |
| සී/ස WAPCO | පරිසර සංරක්ෂණය (Environmental Preservation) | 86 | 50 | | |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** — නැවත වලංගු කිරීමේ ක්‍රියාවලිය 2023 දී ආරම්භ කර ඇති අතර තවමත් ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

**විගණකගේ නිර්දේශයන්** — ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි.

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ආ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 අගෝස්තු 18 දිනැති අංක ER/AB/US/01(vol i) දරන ලිපිය ප්‍රකාරව එම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සියල්ල 2020 වර්ෂය අවසානයේදී නතර කර තිබුණි. කෙසේ වෙතත්, උපදේශකයින් විසින් උපදේශන වාර්තා 68ක් ඉදිරිපත් කර නොතිබුණි. | 2020 ඔක්තෝම්බර් මාසයේදී කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හේතුවෙන් සීමා කිරීම් නිසා ලබා දුන් වාර්තා සමාලෝචනය කිරීමට නොහැකි විය. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| ඇ) | ව්‍යාපෘතිය අවසන් කලයුතු දිනය 2024 මාර්තු 31 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණද, ව්‍යාපෘතිය විසින් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාවේ යෙදවීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. තවද, උපදේශන වාර්තා 20 ක් 2022 දෙසැම්බර් 31 දක්වාම සමාලෝචනය කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හේතුවෙන් ලබා දුන් වාර්තා සමාලෝචනය කිරීමට නොහැකි විය. | වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| ඈ) | 2022 අප්‍රේල් 27 වැනි දින ව්‍යාපෘතිය නැවත ආරම්භ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනතුරුත් ව්‍යාපෘතියේ සංශෝධිත කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, මෙවැනි තත්ත්වයක් තුල ඉදිරි ව්‍යාපෘති කටයුතු නියමිත වේලාවට නිම කිරීම සම්බන්ධයෙන් විගණනයේදී සැක සහිත බව නිරීක්ෂණය විය. | සියලුම කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |